# මධ්‍ය ආසියාවේ සේද මාවත ආශ්‍රිත බෞද්ධ රාජ්‍යයන් පිළිබඳව පුරාවිද්‍යා මූලාශ්‍රය ඇසුරෙන් විමසුමක්

ඒ. එම්. ප්‍රසාදි අප්සරා අදිකාරම්*

බුදුදහම සමස්ත ආසියාව තුළ ව්‍යාප්ත වීමේ දී මධ්‍ය ආසියාව කේන්ද්‍ර කොටගෙන සාර්ථක ලෙස ව්‍යාප්ත විය. මධ්‍ය ආසියානු කලාපය ඔක්සස් මිටියාවත සහ බදක්ෂාන් ප්‍රදේශය පුරා පැතිර පවතී. ලෝක ප්‍රකට ''සේද මාවත'' මෙහි ලා වැදගත් ඓතිහාසික මාර්ගයකි. එය මෙම ප්‍රදේශය පුරා බුදුසමය ව්‍යාප්ත වීමට උපස්ථම්භක විය. සේද මාවත ආශ්‍රිත මධ්‍ය ආසියානු බෞද්ධ රාජ්‍යයන් පිළිබඳව පුරාවිද්‍යාත්මක අධ්‍යයනය තුළින් අතීතයෙහි එම ප්‍රදේශයන්හි පැවති බෞද්ධ ශ්‍රී විභූතිය හඳුනාගැනීමට හැකිවේ ද යන්න මෙහි අධ්‍යයන ගැටලුවයි. වර්තමානයෙහි ඉතිරිව ඇත්තේ ඒ මහා බෞද්ධ ශිෂ්ඨාචාරයෙහි නෂ්ටාවශේෂයන් පමණි. මධ්‍ය ආසියාවේ බෞද්ධ රාජ්‍යයන් පිළිබඳව ඓතිහාසික අධ්‍යයනයක යෙදෙන්නෙකුට ඒ සඳහා උපයෝගී කරගත හැකි මූලාශ්‍රය චීන දේශාටක වාර්තා, චීන ඓතිහාසික නිල වාර්තා, බෞද්ධ පුරාවස්තු ලෙස ත්‍රිත්වයකි. මෙහි බෞද්ධ රාජ්‍යයන් අතර ඛෝටාන්, කුච, තුංහුවාන්, කර්ෂහර්, කැෂ්සාර් ආදිය ප්‍රධාන වේ. සේද මාවත ආශ්‍රිත බෞද්ධ සිද්ධස්ථාන ආක්‍රමණිකයන්ගේ දැඩි ප්‍රහාර හමුවේ විනාශ වී ගිය අතර පුරාවිද්‍යාඥයින් විසින් සොයාගත් බෞද්ධ නෂ්ටාවශේෂ පමණක් ඉතිරිව ඇත. මෙම සිද්ධස්ථානයන්හි නෂ්ටාවශේෂයන් ගොඩගැනීමට පුරාවිද්‍යාඥයින්ගෙන් ලැබුණු දායකත්වය වැදගත් වේ. බෝවර් අත්පිටපත හමුවත් සමඟ මධ්‍ය ආසියාවේ පුරාවිද්‍යාත්මක ගවේශණයකට පුරාවිද්‍යාඥයින් යොමුවිය. ''ඔරල් ස්ටයින්'' වැනි පුරාවිද්‍යාඥයන්ගේ මූලිකත්වයෙන් මෙම ප්‍රදේශවලින් විහාර, හර්මාවශේෂ, බිතුසිතුවම්, මූර්ති, ශිලාලිපි, ප්‍රතිමා, ගොඩනැගිලි, ඇටකැබලි හා සිවුරු, මහායාන සූත්‍ර අත්පිටපත්, පුවරු වල සිතුවම් කළ චිත්‍ර, සංස්කෘත හෝ බ්‍රාහ්මී අක්ෂර වලින් රචිත ග්‍රන්ථ, ග්‍රන්ථ පිටපත්, විනාශ වී ගිය චිත්‍ර පුවරු, රෙදිවල සිත්තම් කළ චිත්‍ර වැනි බුදුදහමට සම්බන්ධ නටඹුන් රාශියක් සොයාගෙන ඇත. එයට චීන දේශාටක වාර්තා, පුරාවිද්‍යා ගවේෂණ ප්‍රබල දායකත්වයක් සපයා තිබේ. ක්ෂේම භූමි බවට පත් වී මහා පස්කඳු හා වැලි කඳු වලින් යටව පැවති මෙම සිද්ධස්ථාන, පුරාවිද්‍යාඥයින්ට ගවේශණය සඳහා චීන දේශාටක වාර්තා උපකාර වී ඇත. ඒ බව පසුකාලීනව පුරාවිද්‍යාඥයින්ට සිය ගවේෂණයන් සඳහා මෙම සාහිත්‍යය මූලාශ්‍රයන් පාදක වීමෙන් පැහැදිලිය. සේද මාවත ආශ්‍රිතව මධ්‍ය ආසියානු බෞද්ධ ප්‍රබෝධයට දායක වූ බෞද්ධ සිද්ධස්ථාන පිළිබඳව පුරාවිද්‍යා හා සාහිත්‍යය මූලාශ්‍රය ආශ්‍රයෙන් විමසීම මෙහි අරමුණ වේ. මෙමගින් මධ්‍ය ආසියාව කේන්ද්‍ර කරගෙන විසුරුණු, පැතුරුණු දියුණු බෞද්ධ ශිෂ්ටාචාරයක් පැවති බව සේද මාවත ආශ්‍රිත රාජ්‍යයන් ගවේෂණයෙන් නිගමනය කල හැකිය.

ප්‍රමුඛ පද :- බුදු සමය, බෞද්ධ ප්‍රබෝධය, නෂ්ටාවශේෂ, පුරාවිද්‍යාඥයන්, විනාශය

* පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය apsaraprasadi89@gmail.com